# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,808 - 2013 අප්‍රේල් මස 26 වැනි සිකුරාදා - 2013.04.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — | පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — | තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — | විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1078 | ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - (i) රේගු (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) පනත් කෙටුම්පත 2013 පෙබරවාරි මස 22 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 මැයි මස 17 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 මැයි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1077 - B 80724— 6,950 (2013/04)
F1 -

# පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ 2013 අංක 01 දරන ප්‍රජා මූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 2013.03.19 වැනි දින සම්මත කරන ලදුව, 2013.04.02 වැනි දින වයඹ පළාත් ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියලුදෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කෙරේ.

පී. බී. එම්. සිරිසේන,<br>
ලේකම්,<br>
වයඹ පළාතේ පළාත් සභාව.

2013 අප්‍රේල් මස 04 වැනි දින,<br>
කුරුණෑගල,<br>
වයඹ පළාතේ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.

**වයඹ පළාතේ පළාත් සභාවේ 2013 අංක 01 දරන ප්‍රජා මූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය**

පූර්විකාව

වයඹ පළාත තුළ තිරසාර ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘතීන් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම, පරිපාලනය කිරීම උදෙසා ප්‍රජා මූල සංවිධාන ස්ථාපිත කිරීම, මෙහෙයවීම හා විධිමත් කිරීම පිණිස පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශය යටතේ වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකයක් ස්ථාපනය කිරීම සහ ඊට සම්බන්ධ හෝ අනුෂාංගික කරුණු සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක දිනය

1. මෙම ප්‍රඥප්තිය "වයඹ පළාතේ පළාත් සභාවේ 2013 අංක 01 දරන ප්‍රජා මූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන අතර, වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කරනු ලැබූ දින සිට බලාත්මක වන්නේ ය.

අරමුණු

2. (1) පළාතේ ජනතාවට ජල සම්පාදනය හා පාරිසරික සනීපාරක්ෂාව උදෙසා ගොඩනැගෙන ප්‍රජා මූල සංවිධානවල තිරසරභාවය සුරක්ෂිත කිරීම, නියාමනය, මගපෙන්වීම සහ පරිපාලනය.
   (2) ප්‍රතිලාභී ජනතාවගේ ජල සම්පාදනය හා පාරිසරික සනීපාරක්ෂාව ප්‍රවර්ධනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
   (3) පළාතේ ක්‍රියාත්මකවන ජල සම්පාදනය හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘති පොදු කළමනාකරණ ක්‍රියාවලියකට අනුගත කිරීම.
   (4) වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය ස්ථාපිත කිරීම.

### *I වැනි කොටස*

*වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය පිහිටුවීම, එහි සංයුතිය හා පරිපාලනය*

පළාත් ඒකකය පිහිටුවීම

3. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා සහ ඒ යටතේ පිහිටුවනු ලබන පළාත් කමිටුවේ පරමාර්ථ හා කර්තව්‍යයන් ඉටුකරළීම උදෙසා මෙහි මින් මතු "පළාත් ඒකකය" ලෙස හැඳින්වෙන පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයාගේ පාලනය යටතේ ස්ථාපනය කළ හැක්කේ ය.

පළාත් ඒකකයේ අධ්‍යක්ෂවරයා හා කාර්ය මණ්ඩලය

4. (1) පළාත් ඒකකයේ අධ්‍යක්ෂවරයා වශයෙන් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III ශ්‍රේණියට නොඅඩු නිලධාරියෙකු විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය මත පළාතේ ආණ්ඩුකාරවරයා විසින් පත් කළ යුත්තේ ය.

   (2) පළාත් ඒකකයෙහි රාජකාරි ඉටුකිරීමට අවශ්‍ය වන්නා වූ කාර්ය මණ්ඩලය වයඹ පළාත් රාජ්‍ය සේවයේ නියුතු යම් නිලයක් දරන්නකුට රාජකාරි පැවරීම මගින් ලබා ගැනීමට පළාතේ ප්‍රධාන ලේකම්වරයාට නියමයක් මගින් විධිවිධාන සැළැස්විය හැක්කේ ය.

5. පළාත් ඒකකයෙහි කෙරෙන්නා වූ සියළුම කාර්යයන් හා කර්තව්‍යයන් පිළිබඳ පරිපාලනය පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා වෙත පැවරෙන්නේ ය. පළාත් ඒකකයෙහි පරිපාලනය

6. ඉහත 4 වැනි වගන්තිය යටතේ තම නිත්‍ය තනතුරට අතිරේකව පළාත් ඒකකයෙහි රාජකාරි පැවරෙන නිලධාරියෙකුට එසේ රාජකාරි පැවරීම මත සිය නිත්‍ය තනතුරට හිමි වැටුප් හා දීමනාවලට අතිරේකව පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් ගෙවිය හැක්කේ ය. පළාත් ඒකකයේ වැටුප් හා දීමනා

## *II වැනි කොටස*

### *ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචිය හා අධීක්ෂණය*

7. (1) මෙම ප්‍රඥප්තිය බලාත්මකවන දින වනවිට පළාත තුළ ජල සම්පාදන හෝ පාරිසරික සනීපාරක්ෂාවට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන පරිපාලනය කරන හෝ එකී ව්‍යාපෘති වැඩවලට අදාළ වූ කිසියම් කාර්යක නියැලී සිටින සෑම ප්‍රජා මූල සංවිධානයක් ම ප්‍රඥප්තිය බලාත්මක වී මාස 03 ක් ඉක්මයාමට ප්‍රථම ලියාපදිංචිය සඳහා පළාත් ඒකකයේ අධ්‍යක්ෂ වෙත විධිමත් අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය. ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචිය

(2) මෙම ප්‍රඥප්තිය බලාත්මක වන දිනයෙන් පසුව සැළසුම් කොට ආරම්භ කරන්නා වූ ජල සම්පාදන හෝ පාරිසරික සනීපාරක්ෂාවට අදාළ යම් ව්‍යාපෘතියක් පිළිබඳ ඕනෑම කාර්යකට සම්බන්ධවන්නා වූ සෑම ප්‍රජා මූල සංවිධානයක්ම එසේ සම්බන්ධවීමට දින 14 කට පෙර පළාත් ඒකකයේ අධ්‍යක්ෂවරයා වෙත ලියා පදිංචිය සඳහා අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

(3) ඉහත (1) හා (2) උපවගන්ති යටතේ ලියාපදිංචිය සඳහා වන අයදුම්පතක් ඒකකයට ලද දින සිට දින 30 ක් ඇතුළත ප්‍රජා මූල සංවිධාන ලියාපදිංචි කිරීම හෝ හේතු දක්වා ප්‍රතික්ෂේප කිරීම පළාත් ඒකකයේ අධ්‍යක්ෂවරයා විසින් කළ යුතු ය. එසේ අයදුම්පත ප්‍රතික්ෂේප කිරීම නැවත අයදුම්පතක් ඉදිරිපත් කිරීමට බාධාවක් නොවන්නේ ය.

8. (1) එසේ ලියාපදිංචි වීමෙන් පසු ඒ සෑම ප්‍රජා මූල සංවිධානයක්ම සිය කටයුතු කරගෙන යාම සඳහා පළාත් ඒකකය වෙතින් වාර්ෂික බලපත්‍රයක් ලබා ගත යුතු ය. වාර්ෂික බලපත්‍ර

(2) ඒ සඳහා විධිමත් අයදුම්පතක් පළාත් ඒකකයේ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, අධ්‍යක්ෂවරයා විසින් අයදුම්පත ඉදිරිපත් කරන අවස්ථාවේ දී හෝ පසුව අදාල ජල මූලාශ්‍රයේ ජීව හා රසායනික තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ප්‍රජා මූල සංවිධානයේ වාර්ෂික විගණන වාර්තාවක් හා අදාළ වන්නා වූ වෙනත් යම් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස ප්‍රජා මූල සංවිධානයට නියම කළ හැකි ය.

(3) මෙම වාර්තා සහ අනුශාංගික වෙනත් කරුණු සැළකිල්ලට ගෙන පළාත් ඒකකයේ අධ්‍යක්ෂවරයා විසින් වාර්ෂික බලපත්‍රයක් නිකුත් කිරීම හෝ නොකිරීම කළ යුතු ය.

(4) වාර්ෂික බලපත්‍රය නිකුත් නොකරන්නේ නම් අදාළ වාර්තාව ද සමග නිවැරදි ලෙස අයදුම්පත ඉදිරිපත් කළ දින සිට මසක් ඇතුළත හේතු සහිතව ඒ බව ඒකකයේ අධ්‍යක්ෂවරයා විසින් අදාළ ප්‍රජා මූල සංවිධානයට ලිඛිතව දැක්විය යුතු ය.

(5) එසේ ප්‍රතික්ෂේප කළ අයදුම්පතක් පිළිබඳව ප්‍රතික්ෂේප කළ දින සිට මසක් ඇතුළත ලේකම්වරයාට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. එබඳු අභියාචනා පිළිබඳව ලේකම්වරයාට සුදුසු තීරණයක් ගත හැකි ය.

(6) වාර්ෂික බලපත්‍රයක් රහිතව යම් ප්‍රජා මූල සංවිධානයක් පානීය ජල සම්පාදන කාර්යයෙහි නියැලෙන්නේ නම් එම ප්‍රජා මූල සංවිධාන සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ 11 වැනි වගන්තිය ප්‍රකාර කටයුතු කළ යුතු වන්නේ ය.

9. ඉහත 7 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි වන්නා වූ ප්‍රජා මූල සංවිධානවල කාර්යයන් වත්කම් හා වගකීම් අධීක්ෂණය, විමර්ෂණය හා උපදෙස් දීම පිළිබඳ බලය ඒකකයට හෝ ඒකකයේ මගපෙන්වීම හා උපදෙස්වලට අනුකූලව එකී ප්‍රජා මූල සංවිධානය පිහිටි බල ප්‍රදේශයට අයත් පළාත් පාලන ආයතනයට ඇත්තේ ය. ප්‍රජා මූල සංවිධාන අධීක්ෂණය

10 (1) ඉහත 7 වගන්තිය යටතේ ලියාපදිංචි වන්නා වූ ප්‍රජා මූල සංවිධානවල කාර්යයන් හා කාර්තව්‍යයන් පිළිබඳව මගපෙන්වීම හා උපදෙස්දීම පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයාට කළ හැක්කේ ය. අමාත්‍යවරයා සතු බලතල

(2) එසේ දෙනු ලබන මගපෙන්වීම හා උපදෙස් අදාළ ප්‍රජා මූල සංවිධානය විසින් ක්‍රියාත්මක නොකරන බවට හෝ පැහැර හරින බවට ඒකකයේ අධ්‍යක්ෂවරයා විසින් වාර්තා කරන්නේ නම් 11 වැනි වගන්තියේ ප්‍රකාරව ක්‍රියාත්මක කිරීම හෝ නොකිරීම පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කිරීමට පරීක්‍ෂණ නිලධාරියෙකු හෝ පරීක්ෂණ මණ්ඩලයක් පත් කිරීමට විෂය භාර අමාත්‍යවරයාට බලය ඇත්තේ ය. ඒකකයේ අධ්‍යක්ෂවරයා විසින් කරනු ලබන නිර්දේශ විමර්ශනය කිරීමට සුදුසු විශේෂඥ දැනුමක් ඇති අයගෙන් එම පරීක්ෂණ මණ්ඩලය සමන්විත විය යුත්තේ ය.

(3) මෙම ප්‍රඥප්තියේ සඳහන් කාර්යයන් ඉටුකර ගැනීම සඳහා අමාත්‍යවරයාට අවශ්‍ය අවස්ථාවල දී නියෝග පැනවිය හැක්කේ ය.

(4) පළාත් කමිටුවේ හා ප්‍රාදේශීය කමිටුවල කාර්යයන් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් සාමාන්‍ය හෝ විශේෂ විධිවිධාන, නියෝග පැනවිය හැක්කේ ය.

(5) පළාත් කමිටුව ස්වකීය බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ දී අමාත්‍යවරයා විසින් කලින් කල මගපෙන්වීම් හා උපදෙස් දිය හැක්කේ ය.

(6) මෙම ප්‍රඥප්තියේ 11 වැනි වගන්තියේ ප්‍රකාරව ක්‍රියා කිරීම සඳහා යම් පළාත් පාලන ආයතනයකට නියෝග කිරීමට විෂය භාර අමාත්‍යවරයාට බලය ඇත්තේ ය.

ප්‍රජා මූල සංවිධාන පවරා ගැනීම

11. (1) ඉහත 7 වැනි වගන්තියේ විධිවිධාන අනුව ලියාපදිංචි නොවන හෝ 8 වැනි වගන්තිය අනුව වාර්ෂික බලපත්‍රය ලබා නොගත් හෝ ඉහත 10 (2) උපවගන්තිය යටතේ පරීක්ෂණයේ නිර්දේශය මත අමාත්‍යවරයා නියෝග කරනු ලබන ප්‍රජා මූල සංවිධාන මගින් මෙහෙයවනු ලබන හෝ පරිපාලනය කරනු ලබන පළාත තුළ පිහිටි ජල සම්පාදන හෝ පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳ ව්‍යාපෘතිවල සියලු වත්කම් හා වගකීම් ව්‍යාපෘතිය පිහිටි ප්‍රදේශයේ පළාත් පාලන ආයතනයට පවරාගත හැක්කේ ය.

(2) එසේ පවරා ගනු ලබන යම් ව්‍යාපෘතියක් පළාත් පාලන විෂය භාර ලේකම්වරයා නිශ්චය කරන පරිදි, පවරා ගනු ලැබූ පළාත් පාලන ආයතනය විසින් මෙහෙයවීම හා පරිපාලනය කිරීම හෝ ලේකම්වරයා විසින් පනවනු ලබන විධිවිධානයන්ට යටත්ව ප්‍රතිසංවිධාන කරන ලද ප්‍රජා මූල සංවිධානයකට පැවරීම කළ හැක්කේ ය.

## *III වැනි කොටස*

*ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳ පළාත් කමිටුව පිහිටුවීම, එහි සංයුතිය හා කාර්ය භාරය*

පළාත් කමිටුව

12. විෂය භාර අමාත්‍යවරයා විසින් මෙහි මින් මතු "පළාත් කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳ පළාත් කමිටුව පිහිටුවිය හැක්කේ ය.

පළාත් කමිටුවේ සංයුතිය

13 පළාත් කමිටුව පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු ය :-

(1) කමිටුවේ සභාපතිවරයා විය යුතු වයඹ පළාතේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා,
(2) කමිටුවේ ලේකම්වරයා විය යුතු වයඹ පළාත් ඒකකයේ අධ්‍යක්ෂවරයා,
(3) පළාත් පාලන විෂය භාර වයඹ පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා,
(4) අධ්‍යාපන විෂය භාර වයඹ පළාත් අමාත්‍යාංශයේ ලේකම්වරයා,
(5) ඉංජිනේරු සේවා විෂය භාර වයඹ පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරයා,
(6) කුරුණෑගල හා පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරුන් හෝ ඔවුන්ගේ නියෝජිතයින්,
(7) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වයඹ පළාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා,
(8) වයඹ පළාත් පාලන කොමසාරිස්වරයා,
(9) වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා,
(10) වයඹ පළාත් පරිසර අධිකාරියේ අධ්‍යක්ෂවරයා,
(11) වයඹ පළාත් මාර්ග දෙපාර්තමේන්තුවේ සහ මහා මාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන්,
(12) ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘති ක්‍රියාත්මක කරන පළාත් පාලන ආයතනවල ලේකම්වරුන්,
(13) කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්කවල ප්‍රජා මූල සංවිධාන දිස්ත්‍රික් සංසද සභාපතිවරු දෙදෙනා,
(14) දැනට ක්‍රියාත්මක වන හෝ මින් මතු පළාත තුළ ආධාර යටතේ ක්‍රියාත්මක විය හැකි ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘතියක ප්‍රධානියා.

පළාත් කමිටුවේ කාර්ය භාරය

14. පළාත් කමිටුවේ කාර්ය භාරය පහත පරිදි වේ :-

(1) ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂාවට අදාළ ප්‍රතිපත්ති හා වැඩ සටහන් සම්පාදනය කිරීම,
(2) පළාත තුළ ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක අවශ්‍යතා නිර්ණය කිරීම,
(3) පළාත් ඒකකය ඉදිරිපත් කරන සංවර්ධන සැළසුම් සමාලෝචනය කිරීමෙන් අනතුරුව අනුමත කිරීම හෝ සංශෝධන සහිතව අනුමත කිරීම හෝ නුසුදුසු යැයි තීරණය කරන්නේ නම් ප්‍රතික්ෂේප කිරීම,
(4) පවත්නා ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘතිවල මෙහෙයුම් හා නඩත්තු ක්‍රියාවලින් නිගමනය කිරීම,
(5) ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘති යෝජනා ක්‍රම හා වැඩ සටහන් සඳහා මුල්‍ය ප්‍රතිපාදන සැපයීමේ නිර්දේශ විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම,
(6) ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂාවට අදාළ ක්‍රියාකාරකම් හා සම්බන්ධිත රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික සහාය සේවා පද්ධතීන්ගේ සහාය ලබා ගැනීම හා සම්බන්ධීකරණය කිරීම.

15. (1) පළාත් කමිටුව යටත් පිරිසෙයින් මාස දෙකකට වරක් රැස්විය යුතු ය. අවශ්‍යවන්නේ නම් සභාපතිවරයාගේ උපදෙස් මත ලේකම්වරයා විසින් අතිරේක රැස්වීම් කැඳවනු ලැබිය හැක්කේ ය.

(2) පළාත් කමිටුවේ රැස්වීමක ගණ පූර්ණය අවම වශයෙන් සාමාජිකයින් දසදෙනෙක් විය යුතු ය.

## *IV වැනි කොටස*

*ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳ ප්‍රාදේශීය කමිටු පිහිටුවීම සහ එහි සංයුතිය, කාර්ය භාරය හා බලතල*

16. මෙහි මින් මතු "ප්‍රාදේශීය කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂාව පිළිබඳව ප්‍රාදේශීය කමිටුව පළාත් පාලන ආයතන බල ප්‍රදේශයෙහි පිහිටුවිය හැකි ය. ප්‍රාදේශීය කමිටුව.

17. පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ ජීවත්වන්නා වූ ප්‍රජාවගේ සුබ විහරණය සඳහා අවශ්‍ය වන්නා වූ ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘතිවල තිරසාර පැවැත්ම සහතික කිරීම පිණිස අවශ්‍යවන්නා වූ ප්‍රතිපත්තිමය හා කළමනාකරණ තීරණ ගැනීමට පළාත් කමිටුවේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමට දායකවීම, ප්‍රාදේශීය කමිටුවේ පරමාර්ථය වන්නේ ය. ප්‍රාදේශීය කමිටුවෙ පරමාර්ථ

18. ප්‍රාදේශීය කමිටුව පහත දැක්වෙන සාමාජිකයින්ගෙන් සමන්විත විය යුත්තේ ය. ප්‍රාදේශීය කමිටුවේ සංයුතිය.

(1) ප්‍රාදේශීය කමිටුවේ සභාපති විය යුතු අදාල පළාත් පාලන ආයතනයේ සභාපතිවරයා,
(2) ප්‍රාදේශීය කමිටුවේ ලේකම්වරයා විය යුතු අදාළ පළාත් පාලන ආයතනයේ ජල හා සනීපාරක්ෂක විෂය භාර නිලධාරියා,
(3) ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්වරු හෝ ඔවුන්ගේ නියෝජිතවරු,
(4) පළාත් පාලන ආයතනයේ ලේකම්වරයා,
(5) ප්‍රදේශයේ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරයා,
(6) ප්‍රදේශයේ ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිවරයා හෝ ඔහුගේ නියෝජිතවරයෙකු,
(7) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ පළාත් භාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී විසින් නම් කළ එම මණ්ඩලයේ නිලධාරියෙක්,
(8) ප්‍රජා මූල සංවිධාන ප්‍රාදේශීය සංසදයේ සභාපතිවරයා සහ ලේකම්වරයා,
(9) ගොවිජන සේවා ප්‍රාදේශීය නිලධාරි.

19. පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ, ප්‍රාදේශීය කමිටුවේ කාර්ය භාරය.

(1) ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක අවශ්‍යතා හා ගැටළු හඳුනාගෙන පළාත් කමිටුව වෙත ඉදිරිපත් කිරීම.
(2) පවත්නා ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘතිවල පැවැත්ම හා ප්‍රගතිය අධීක්ෂණය
(3) ප්‍රජා මූල සංවිධානවල ක්‍රියාකාරකම් අධීක්ෂණය හා මෙහෙයවීම.
(4) ප්‍රජා මූල සංවිධාන අතර අන්තර් සම්බන්ධීකරණය
(5) පළාත් ඒකකය විසින් කළ යුතු යැයි නියම කෙරෙන කාර්යයන් ඉටු කිරීම.

ප්‍රාදේශීය කමිටුවේ කාර්ය භාරය වන්නේ ය.

20. (1) ඉහත 19 වගන්තියේ සඳහන් කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා ප්‍රාදේශීය කමිටුවලට බලතල ඇත්තේ ය. ප්‍රාදේශීය කමිටුවේ බලතල
(2) පළාත් කමිටුව විසින් පළාත් ඒකකයේ අධ්‍යක්ෂවරයා මගින් නියම කරනු ලබන කාර්යයන් කිරීම සඳහා අවශ්‍ය බලතල ඇත්තේ ය.
(3) ප්‍රාදේශීය කමිටුව විසින් ස්වකීය බලතල හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමේ දී පළාත් කමිටුව විසින් කලින් කල නිකුත් කරනු ලබන සාමාන්‍ය හෝ විශේෂ විධි විධාන හා උපදෙස් වලට අනුකූලව ක්‍රියාකළ යුත්තේ ය.

21. (1) ප්‍රාදේශීය කමිටුව යටත් පිරිසෙන් මාස දෙකකට වරක් රැස්විය යුතු අතර, අවශ්‍යවන්නේ නම් සභාපතිවරයාගේ උපදෙස් මත ලේකම්වරයාට අතිරේක රැස්වීම් කැඳවිය හැක්කේ ය. ප්‍රාදේශීය කමිටුවේ රැස්වීම්.

(2) ප්‍රාදේශීය කමිටුවේ රැස්වීමක සන පූර්ණය සමස්ථ සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.
(3) ප්‍රාදේශීය කමිටුව විසින් එහි රැස්වීම්වල කාර්යය සහ කටයුතු කරගෙන යාම උදෙසා අවශ්‍ය පරිපාටි සම්පාදනය කර ගත හැක්කේ ය.

## *V වැනි කොටස*

*ප්‍රාදේශීය ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය පිහිටුවීම*

22. මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවනු ලබන ප්‍රාදේශීය කමිටුවේ පරමාර්ථ හා කාර්යයන් ඉටු කරලීම උදෙසා මෙහි මින් මතු "ප්‍රාදේශීය ඒකකය" යනුවෙන් හඳුන්වනු ලබන ප්‍රාදේශීය ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය පළාත තුළ පිහිටි පළාත් පාලන ආයතන කාර්යාලයන් හි ස්ථාපනය කළ හැක්කේ ය. ප්‍රාදේශීය ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය.

23. 22 වැනි වගන්තිය යටතේ ස්ථාපනය කෙරෙන ප්‍රාදේශීය ඒකකයේ රාජකාරි ඉටු කිරීමට අවශ්‍යවන්නා වූ කාර්ය මණ්ඩල සහාය ප්‍රදේශයේ පළාත් පාලන ආයතනය හි සේවයේ නියුතු ඕනෑම තනතුරක් දරන්නෙකුට රාජකාරි පැවරීම මගින් ලබා ගැනීමට නියමයන් මගින් විධි විධාන සැළැස්වීම පළාතේ පළාත් පාලන කොමසාරිස්වරයා විසින් කළ යුත්තේ ය. ප්‍රාදේශීය ඒකකයේ කාර්ය මණ්ඩලය.

ප්‍රාදේශීය ඒකකයේ පරිපාලනය.

24. ප්‍රාදේශීය ඒකකයේ කෙරෙන සියළුම කාර්යයන් හා කර්තව්‍යයන් පිළිබඳව පරිපාලනය පළාත් පාලන කොමසාරිස්වරයාගේ හා පළාත් ඒකකයේ අධ්‍යක්ෂවරයාගේ මඟපෙන්වීම්වලට අනුකූලව පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාට පැවරෙන්නේ ය.

ප්‍රාදේශීය ඒකකයේ වැටුප් හා දීමනා.

25. 23 වැනි වගන්තිය යටතේ නිත්‍ය තනතුරෙහි රාජකාරිවලට අමතරව ප්‍රාදේශීය ඒකකයෙහි රාජකාරි පැවරෙන නිලධාරියෙකුට එසේ රාජකාරි පැවරීම මත සිය නිත්‍ය තනතුරට හිමි වැටුප් හා දීමනාවලට අතිරේකව පාරිශ්‍රමිකයක් හෝ දීමනාවක් ගෙවිය හැක්කේ ය.

## *VI වැනි කොටස*

### *මූල්‍ය ප්‍රතිපාදන*

මූල්‍ය ප්‍රතිපාදන

26. මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන්නා වූ මූල්‍ය ප්‍රතිපාදන -

(1) පළාත් සභාවේ වාර්ෂික ආදායම් වියදම් ප්‍රකාශන හා අයවැය ඇස්තමේන්තු මගින්,
(2) පළාත් පාලන ආයතනවල වාර්ෂික අය වැය මගින්,
(3) රාජ්‍ය නොවන සංවිධාන හෝ පෞද්ගලික හෝ වෙනත් බාහිර මූලාශ්‍ර මගින්,
(4) ව්‍යාපෘති සඳහා ලබා දෙන මූල්‍ය ප්‍රතිපාදන මගින්,

සළසා දිය හැක්කේ ය.

## *VII වැනි කොටස*

### *පොදු විධිවිධාන*

නියෝග ගැසට් පත්‍රයේ පළ කිරීම.

27. මෙම ප්‍රඥප්තියේ විධි විධාන හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ හෝ ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි පසු දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

නියෝග සඳහා පළාත් සභා අනුමැතිය ලබා ගැනීම.

28 (1) අමාත්‍යවරයා විසින් පනවනු ලබන සෑම නියෝගයක්ම එය *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින්, අනුමැතිය සඳහා පළාත් සභාව හමුවේ තැබිය යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එය එසේ අනුමත කරනු නොලැබූ දිනයෙහි පටන් පරිච්ඡින්න වූ ලෙස සළකනු ලැබිය යුතු නමුදු එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතුය. අමාත්‍යවරයා විසින් පනවන ලද යම් නියෝගයක් යම් දිනයක පරිච්ඡින්න වී යයි එසේ සළකනු ලැබේ ද ඒ දිනය පිළිබඳ නිවේදනයක් *ගැසට් පත්‍රයෙහි* පළකළ යුතුය.

(2) අමාත්‍යවරයා විසින් පනවන ලද යම් නියෝගයක් පළාත් සභාව විසින් අනුමත කරනු ලැබූ විට එය මෙහි ලා පනවන ලද්දක් මෙන් වලංගුව බල පැවැත්විය යුතුය. එය අනුමත කිරීම පිළිබඳ නිවේදනයක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු ය.

වැරදි

29. මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ හෝ සාදන ලද යම් නියෝගයක් හෝ විධිවිධානයක් හෝ කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම උවමනාවෙන්ම පැහැර හරින හෝ උවමනාවෙන්ම අවහිර කරන අයෙකු මෙම ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරුවෙකු වන්නේ ය.

නඩු පැවරීමේ බලය.

30. මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සිදු කරනු ලැබූ විට නඩු පැවරීමේ බලය ඒකකයේ අධ්‍යක්ෂවරයා වෙත හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු සතු වන්නේ ය.

දඬුවම්.

31. මෙම ප්‍රඥප්තිය යටතේ යම් වරදක් සිදු කරනු ලබන සෑම තැනැත්තෙකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයක දී වරදකරු කරනු ලැබීමෙන් අනතුරුව රු. 5,000 කට නොඅඩු හා රු. 20,000 කට නොවැඩි දඩයකට හෝ මාස 06 ක් නොඉක්මවන කාලයකට බන්ධනාගාර ගත කිරීමකට හෝ යන දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට හෝ එකී දණ්ඩනයන් දෙකටම හෝ යටත් කළ හැකි වන්නේ ය.

## *VIII වැනි කොටස*

### *අර්ථ නිරූපනය*

අර්ථ නිරූපනය.

32. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්තයක් අවශ්‍යවන්නේ නම් මිස,

(1) "පළාත" යන්නෙන් වයඹ පළාත ද,
(2) "ආණ්ඩුකාරවරයා" යන්නෙන් වයඹ පළාතේ ආණ්ඩුකාරවරයා ද,
(3) "අමාත්‍යවරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා ද,

(4) "ප්‍රධාන ලේකම්වරයා" යන්නෙන් වයඹ පළාතේ ප්‍රධාන ලේකම්වරයා ද,

(5) "ලේකම්වරයා" යන්නෙන් වයඹ පළාතේ පළාත් පාලන විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාද,

(6) "කොමසාරිස්වරයා" යන්නෙන් වයඹ පළාත් පාලන කොමසාරිස්වරයා ද,

(7) "ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය" යන්නට 1974 අංක 2 දරන පනතින් සංස්ථාපිත ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ද,

(8) "ප්‍රජා මූල සංවිධාන" යන්නෙන් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක සේවා සැපයීමේ හා කළමනාකරණය සඳහා සේවා ලාභී ප්‍රජාව නියෝජනය කරමින් පිහිටුවා ගනු ලැබූ හා අදාළ නීතියක් හෝ මෙම ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සංවිධානයක් ද,

(9) "ප්‍රජා මූල ප්‍රාදේශීය සංසදය" යන්නෙන් පළාත් පාලන ආයතන බල ප්‍රදේශය තුළ ඇති සෑම ප්‍රජා මූල සංවිධානයක්ම නියෝජනය කරමින් එකී සංවිධාන විසින් සාමූහිකව පිහිටුවා ගත් සංවිධානයක් ද,

(10) "ප්‍රජා මූල සංවිධාන දිස්ත්‍රික් සංසදය" යන්නෙන් දිස්ත්‍රික්කය තුළ ඇති සෑම ප්‍රජා මූල ප්‍රාදේශීය සංසදයක්ම නියෝජනය කරමින් එකී සංසද විසින් සාමූහිකව පිහිටුවාගත් සංවිධානයක් ද,

(11) "ජල සම්පාදනය" යන්නෙන් පළාත තුළ වාසය කරන ජනතාවට ජලය සැපයීම අරමුණු කොට රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධාන මගින් හෝ ප්‍රජාවගේ සහභාගීත්වයෙන් හෝ මැදිහත්වීමෙන් ඉදිකරනු ලබන හා ක්‍රියාත්මක කරනු ලබන පානීය ජල ව්‍යාපෘති මෙහෙයවීමට ගොඩ නැගෙන ප්‍රජා මූල සංවිධාන වල ප්‍රතිලාභීන්ට සතුන් හෝ රථ වාහන, විකිණීම, කුලියට දීම පිණිස තබා ඇති අවස්ථාවක දී ඒ සතුන් හෝ රථ වාහන සේදීම සඳහා ජල සම්පාදනයක් හෝ යම් වෙළඳාමක් නිෂ්පාදනයක් හෝ ව්‍යාපාරයක් සඳහා හෝ වතුර මල් පිහිණුම් පොකුණු සඳහා හෝ යම් විසිතුරු හෝ යාන්ත්‍රික කාර්යයන් සඳහා වූ හෝ වාරිමාර්ග කාර්යයන් සඳහා වූ ජල සම්පාදනයක් නොවන ජලය සැපයීම ද,

(12) "පාරිසරික සනීපාරක්ෂාව" යන්නෙන් ජල සම්පාදනය, වැසිකිළි, ජල අපවහනය යන කරුණු සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය හෝ රාජ්‍ය නොවන සංවිධාන මගින් හෝ මැදිහත්වීමෙන් ඉදිකරනු ලබන ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති පාලනය කිරීම ද,

(13) "පළාත් සභාව" යන්නෙන් වයඹ පළාතේ පළාත් සභාව ද,

(14) "පළාත් ඒකකය" යන්නෙන් වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකය ද,

අදහස් වේ.

33. මෙම ප්‍රඥප්තියේ සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

04-812

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.